## <u>වෙන් කර ගන්නා ආකාරය</u>

- මෙම සංචාරක බංගලාව වෙන් කිරීමේ වරප්‍රසාදය හිමිව ඇත්තේ රාජ්‍ය අංශයේ නිලධාරීන්ට පමණක් බව කරුණාවෙන් සලකන්න.
- සංචාරක බංගලාව වෙන් කර ගැනීම සඳහා මේ සමග දක්වා ඇති අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර ගෙන මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පැමිණ හෝ පහත දුරකථන අංකය ඇමතීමෙන් සිදුකර ගත හැක.
- නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයට අදාළ පහසුකම් ලබා ගත හැකිදැයි දුරකථනයෙන් විමසීමෙන් අනතුරුව පහත ගිණුමට මුදල් බැර කළ හැකිය. ඉන් අනතුරුව අයදුම්පත හා බැංකු රිසිට් පත 081 - 2233186 අංකයට ෆැක්ස් මගින් හෝ development.kds@gmail.com වෙත ඊමේල් මගින් යොමු කළ හැක. **(දුරකථනයෙන් විමසා තහවුරු කර ගැනීමෙන් තොරව මුදල් ගෙවීමෙන් වළකින්න.)**

  - **ලංකා බැංකුව - මහනුවර ශාඛාව - ගිණුම් අංකය : 0007041757**
  - **ගිණුම් හිමියාගේ නම : දිස්ත්‍රික් ලේකම්, මහනුවර**

- ඔබට සංචාරක බංගලාව වෙන් කර ගැනීමට හැකි වන්නේ ඔබ අයදුම්පත ඉදිරිපත් කරන දින සිට දින 30ක් ඉදිරියෙන් ඇති (මාසයක් ඉදිරියෙන්) දිනක් සඳහා වේ.

- **විමසීම් දුරකතන අංකය : 081 - 2239129**

## <u>සංචාරක බංගලාව භාවිතයේදී පිළිපැදිය යුතු කොන්දේසි</u>

සංචාරක බංගලාවේ නවාතැන් ගනු ලබන ඔබ පහත සඳහන් කරුණු පිළිබඳව ප්‍රමුඛතාවයක්, සැලකිල්ලක් දක්වනු ඇතැයි අපගේ බලාපොරොත්තුවයි.

- අයදුම්කරු සංචාරක නිවාසයේ අනිවාර්යයෙන් නවාතැන් ගැනීම සිදු කළ යුතු අතර සංචාරක නිවාසයේ නවාතැන් ගැනීමේ දී රාජකාරි හැඳුනුම්පත, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් අනුමත කරන ලද අයදුම්පතේ පිටපතක් හා මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත බංගලා භාරකරු වෙත අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතෙහි සඳහන් නොමැති පුද්ගලයන් සඳහා නවාතැන් පහසුකම් නොසපයන ලෙස සංචාරක නිවාසයේ භාරකරු දැනුවත් කර ඇති බැවින් අයදුම්පතෙහි නම සඳහන්ව නොමැති කිසිදු පුද්ගලයෙකු සංචාරක නිවාසයේ නවාතැන් ගැනීමට රැගෙන නොයා යුතුය.

- **සැ.යු. - අයදුම්කරු නොමැතිව නවාතැන් ගැනීම සඳහා පැමිණෙන පිරිස ආපසු හරවා යැවීමට සිදු වන බව කරුණාවෙන් සලකන්න.**

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රාජකාරි අවශ්‍යතාවයකදී කෙටි දැනුම්දීමකින් මෙම වෙන් කිරීම අවලංගු කිරීමේ පදනම මත සංචාරක බංගලාව වෙන් කරනු ලැබේ. එවැනි අවස්ථාවක දී ගෙවන ලද මුදල ආපසු ගෙවනු ලැබේ.

- අයදුම්කරුගේ හේතුවක් මත වෙන් කරගත් සංචාරක බංගලාව භාවිතා කිරීමට නොහැකි වීම මත ඒ වෙනුවෙන් ගෙවන ලද මුදල් ආපසු ගෙවීමක් හෝ වෙනත් දිනයක් ලබා දීම සිදු කරනු නොලැබේ.

- වෙන් කර ගත් අයදුම්පත්‍රය කිසිදු හේතුවක් නිසා හෝ වෙනත් අයදුම්කරුවෙකු වෙත පැවරීමට ඉඩ දෙනු නොලැබේ.

- නවාතැන් ගන්නා අයගේ අනන්‍යතාවය පිළිබඳව අයදුම්කරු සෑහීමකට පත්විය යුතු අතර, නවාතැන් ගන්නා කාල වකවානුව තුළදී ඒ සම්බන්ධයෙන් වන සියලු වගකීම් අයදුම්කරු විසින් දැරිය යුතුය.

- ඇඳ ඇතිරිලි, තුවා, කොට්ට උර හා සනීපාරක්ෂක පහසුකම් සඳහා සංචාරක නිවාස භාරකරු වෙත ගෙවීම් කළ යුතුය.

- සංචාරක නිවාසයේ ගත කරන කාලය තුළ එහි අභ්‍යන්තර හෝ බාහිර කිසිවකට අලාභ හානි නොකළ යුතුයි. එවැනි අලාභ හානියක් සිදු වූවහොත් එය යථා තත්ත්වයට පත්කිරීමට වන සියලුම වියදම් ඔබ විසින් දැරිය යුතුය.

- මෙම බංගලාවේ උත්සව හෝ සම්භාෂණ පැවැත්වීම හා මත්පැන්, දුම්වැටි භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

- ඔබ සංචාරක නිවාසයේ ගත කරන කාලය තුළ කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔබට විරුද්ධව යම් පැමිණිල්ලක් ලැබුණහොත් ඉදිරියේදී මෙම සංචාරක නිවාසය වෙන් කිරීම පිළිබඳ ඔබේ හා පවුලේ අයගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**සංචාරක නිවාසය වායුසමනය කළ ද්විත්ව කාමර (2 Bed AC) - 02 කින් සහ වායුසමනය නොකළ ද්විත්ව කාමර (2 Bed Non AC) - 01 කින් සමන්විත වේ. සංචාරක නිවාසය වෙන් කිරීම සඳහා දිනක අයකිරීම රු. 5500.00 ක් වන අතර, කාමර වශයෙන් වෙන් කිරීම් සිදු නොකෙරේ.**

<u>සංචාරක බංගලා භාරකරුගේ විස්තර</u>
නම : අරුල් ජේෂන්
දුරකථන අංකය : 077-9419707

<u>බංගලා භාරකරුගෙන් ලබා ගත හැකි පහසුකම්</u>

ඇඳ ඇතිරිලි තුවා ආදිය සඳහා මිල ගණන් (වෙනස් වීමට ඉඩ ඇත)

| | |
|---|---|
| තනි ඇඳ ඇතිරිලි ( Single Bed Sheet ) | රු. 200.00 |
| ද්විත්ව ඇඳ ඇතිරිලි ( Double Bed Sheet ) | රු. 220.00 |
| කොට්ට උර (Pillow Cases ) | රු. 50.00 |
| තුවා ( Towel ) | රු. 220.00 |

නිවේදනය :- අදාළ රෙදිපිළි ඉතා යහපත් හා පිරිසිදු මට්ටමෙන් ලබා දීමට බංගලා භාරකරු බැඳී සිටී. ඒවා භාවිතා කළ නොහැකි අපිරිසිදු මට්ටමින් පවතී නම් ඒ බව භාවිතා කිරීමට ප්‍රථම බංගලා භාරකරුට දැන්වීම හා යහපත් ඒවා ලබා ගැනීම ඔබගේද වගකීමකි.